00004

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - **2020/2021**
අවසාන පරීක්ෂණය - **2022**
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම - **SNP8531/ESP2231**
කාලය - පැය තුනයි. **(03)**

---

දිනය - **21.08.2022** වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. අග්‍රාවෙල්ට (Aggrawel) අනුව අධ්‍යාපන සංකල්ප ප්‍රධාන සාධක හතර (04) මඟින් නිර්මිතය. එම සාධක හතර **(04)** සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

02. එමිල් ඩුර්කයිම්ගේ (Emile Durkheim) අදහස් වලට අනුකූලව අධ්‍යාපන සංකල්පයේ අර්ථය පැහැදිලි කරන්න.

03. යුනෙස්කෝ හි අධ්‍යාපනයේ කුළුණු හතර **(04)** නම් කර 3 වන කුළුණ අන්තර්කරණ අධ්‍යාපනයට සහාය වන ආකාරය පැහැදිලි කරන්න.

04. ආර්. එස්. පීටර්ට (R.S. Peter) අනුව, අධ්‍යාපනයේ දර්ශනයේදී ගනුදෙනු කළ යුතු ප්‍රධාන ගැටලු හතරක් තිබේ. එම ගැටලු නම් කර ඉන් එක් ගැටලුවක් විශේෂ අධ්‍යාපන සුදුසුකම් සහිත ගුරුවරයෙකුට වැදගත් වන්නේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

05. අන්තර්කරණ පන්ති කාමරයක උගන්වන ගුරුවරයෙකුට අධ්‍යාපනික දර්ශනය ප්‍රයෝජනයවත් වන්නේ ඇයි?

06. අන්තර්කරණ අධ්‍යාපන පන්තිකාමර ගුරුවරයෙකුට ජාතික අධ්‍යාපන ඉලක්ක පිළිබඳව මනා දැනුවත්භාවයක් තිබිය යුත්තේ ඇයිද යන්න හේතු හතරක් මඟින් දක්වන්න.

07. ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපනයේ, අධ්‍යාපනික අභිමතාර්ථ සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රධාන කොන්දේසි සඳහන් කරන්න.

08. විශේෂ අධ්‍යාපන විකාශයේ අදියර පහ **(05)** සඳහන් කරන්න.

(ලකුණු 8 X 5 = 40)

## 11 වන කොටස

09. ඒ) ප්ලේටෝගේ (Plato) අධ්‍යාපනික දර්ශනය තුළ දැකිය හැකි ප්‍රධාන අරමුණු සඳහන් කරන්න. (ලකුණු 3)

බී) ප්ලේටෝ (Plato) විසින් හඳුන්වා දුන් අධ්‍යාපනික ව්‍යුහය පැහැදිලි කරන්න.

(ලකුණු 7)

සී) ප්ලේටෝගේ (Plato) අධ්‍යාපනික චින්තනය, ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ අන්තර්කරණ අධ්‍යාපනයක් සඳහා සහාය වන්නේ කෙසේද යන්න උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. "ජෝන් ඩූවීට (John Dewey's) අනුව විෂය මාලාව දරුවන්ගේ අවශ්‍යතා, රුචිකත්වයන් සහ හැකියාවට ගැලපෙන පරිදි සැලසුම් කළ යුතුය"

ඒ) අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳ ජෝන් ඩූවීගේ (John Dewey's) ප්‍රධාන විශ්වාස දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5 )

බී) ජෝන් ඩූවීගේ (John Dewey's) අධ්‍යාපන දර්ශනය කෙතරම් දුරට ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවට අන්තර්ග්‍රහණය වී තිබේද? (ලකුණු 7)

සී) විවිධ අවශ්‍යතා ඇති දරුවන්ට පහසුකම් සැපයීමේ ඉගැනුම් ඉගැන්වීම් ක්‍රම සම්බන්ධයෙන්, ඔබ ජෝන් ඩූවීගේ (John Dewey's) අදහස් අදාළ කර ගන්නේ කෙසේද? උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 8)

11. ජීන් ජැක් රූසෝ (Jean Jacques Rousseau) ළමා කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයේ පුරෝගාමියා වේ.

ඒ) ජීන් ජැක් රූසෝගේ (Jean Jacques Rousseau) ළමා කේන්ද්‍රීය අධ්‍යාපන චින්තනය පැහැදිලි කරන්න.

(ලකුණු 8 )

බී) ජීන් ජැක් රූසෝ (Jean Jacques Rousseau), මහත්මා ගාන්ධි සහ මාරියා මොන්ටිසෝරි යන අයගේ අධ්‍යාපනික චින්තනය පහත අංග යටතේ සසඳන්න.

i. අධ්‍යාපනික චින්තන

ii. විෂය මාලාව

iv. ළමා සංවර්ධනය

(ලකුණු 12)

12. ඒ) මිනිසාගේ ස්වභාවය පිළිබඳ මාක්ස්ගේ (Marx's) අදහස් උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

බී) කාල් මාක්ස්ගේ (Karl Marx's) අධ්‍යාපන යෝජනා සඳහන් කර එම අදහස් ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අරුබුදය විසඳීම සඳහා අධ්‍යාපන ක්‍රමය තුළ භාවිත කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

13. දුබලතා සහිත සිසුන්ට අධ්‍යාපන සේවා සැපයීම සඳහා විවිධ වර්ගයේ විශේෂ වැඩසටහන් ආරම්භ කරන ලදී.

ඒ) දුබලතා සහිත දරුවන්ගේ විශේෂ අධ්‍යාපන සේවා සඳහා ඇති විශේෂ වැඩසටහන් වර්ග හතරක් (04) පැහැදිලි කරන්න.

(ලකුණු 5)

බී) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ සමෝධානිත අවධියේ භාවිතයන් කෙසේදැයි පරීක්ෂා කරන්න.

(ලකුණු 7 )

සී) ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ට පහසුකම් සැලසීමේදී අන්තර්කරණ පාසල් මුහුණ දෙන අභියෝග පැහැදිලි කරන්න.

(ලකුණු 8)

14. ඒ) විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය යන සංකල්ප අතර සම්බන්ධය පරීක්ෂා කරන්න.

(ලකුණු 6 )

බී) දුබලතා සහිත සිසුන්ගේ අධ්‍යාපනය සඳහා වන එක්සත් ජාතීන්ගේ සම්මුතීන් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

සී) ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ භාවිතයන් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 8)

හිමිකම් ඇවිරිණි.